# සිංහල භාෂාව ඉන්දු ආර්ය ගණයේ භාෂාවක් ද?

## ඩබ් මනෝජ් අරියරත්න

සිංහලය ඉන්දු ආර්ය ගණයේ භාෂාවක් ද? යන්න පිළිබඳව අවධානය යොමු කිරීමේ දී සිංහල භාෂාවේ ආරම්භය පිළිබඳ විවිධ විද්වතුන්ගේ මත විමසා බැලීම වැදගත් වේ. සමහර විද්වතුන්ගේ මතය අනුව සිංහලය ඉන්දු ආර්ය ගණයට අයත් වන අතර සමහරෙකුගේ අදහස වන්නේ එය ද්‍රවිඩ ගණයේ භාෂා පවුලකට අයත් වන බවයි. මේ මත දෙක පිළිබඳ ඓතිහාසිකමය හා භාෂාමය සාධක විමසීමෙන් සිංහලය ඉන්දු ආර්ය භාෂා ගණයට අයත් වන්නේ ද යන්න අවබෝධ කර ගත හැකිය.

ඓතිහාසික සාධක පිළිබඳ අවධානය යොමු කිරීමේ දී වංශ කථාවල එන විජය රජු පිළිබඳ පුරාවෘත්තය අපට අමතක කළ නොහැක. මහාවංශය, දීප වංශය වැනි ඓතිහාසික මූලාශ්‍රය මහින් හෙළි වන්නා වූ කරුණු අනුව විජය කුමරා ප්‍රධාන සත්සියක් ජනයාගෙන් ද ඉන්දියාවේ මදුරාපුරයට හසුන්පත් යවා ගෙන්වා ගත් රාජ කුමරියන් සහිත සත් සියයක් කාන්තාවන් ගෙන් ද, ඔවුන් සමඟ ආ විවිධ ශිල්පීන් හා දස දහසක් පවුල්වලින් ද යුත් ජනපදවාසීන්, සිංහල, යන නමින් හැඳින්වූ බව පැහැදිළි වේ.[1] විජයාදීන්ගේ ජන්ම භූමිය එනම් විජයගේ පියා සිංහපුරය ඉදිකළ, දේශය උතුරු ඉන්දියාවේ පිහිටියක් බවට සැකයක් නැතත්, එය උතුරු ඉන්දියාවේ නැගෙනහිර දෙස

---

[1] දීප වංශය නව වන පරිච්ඡේදය, මහාවංශය හත්වන පරිච්ඡේදය

වුවක් ද නැතහොත් බටහිර දෙස වුවක් ද යන්න විවාදයට ලක් වූ කරුණකි.[2]

මහාවංශයෙහි හා දීපවංශයෙහි එන විජය පුරා වෘත්තය සම්බන්ධයෙන් ඉන්දියාව පිළිබඳ ඉතිහාසඥයෙකු වන රැප්සන්ගේ නිරීක්ෂණය ඉතා වැදගත් වේ. "මේ කථාන්තරයෙහි පහත දැක්වෙන ඓතිහාසික න්‍යායය අන්තර්ගත බවක් පෙනේ. ආදිතම පුරාවෘත්තයන්ට මුල් වූ සංක්‍රමණිකයන්ගේ ධාරාව ද්‍රවිඩ වුවා විය හැකි ය. ලාට රට සිංහ පුරයෙන් (එනම් නූතන කතියවාර්හි සිහෝර් පෙදෙසින්) හා සෝපාරාවෙන් ආ ද්විතිය සංක්‍රමණික ධාරාව ආර්ය වුවා විය හැකි ය. මෙම දෙවන කණ්ඩායම සිංහලයන්ට අයත් වූ අතර ඔවුන් කථා කළ ආර්ය භාෂාව මුල් වැස්සන් මත අරෝපණය කළා ද විය හැකිය. කෙසේ වුව ද ඔවුහු ඔවුන්ගේ වාස භූමි කර ගත් අලුත් රටට "සිංහලද්වීපය" යන නම දුන්නෝය.[3]

මේ ප්‍රකාශයට අනුව රැප්සන් ද "සිංහලය ඉන්දු ආර්ය භාෂාවකින් ප්‍රභවය වූයේය" යන්න ඔප්පු කරන ඓතිහාසික සාධකය වූ විජය පුරාවෘත්තය පිළිගත් බව පැහැදිලි වේ.

එසේ ම ලංකාව පිළිබඳ "වාණිජ්‍ය හා සාමාන්‍ය තොරතුරු අත් පොත" නම් කෘතියෙහි කර්තෘ වූ එල්.ජේ.බී. ටර්නර් ජනප්‍රවාද ගත ඉතිහාසයට අනුව ලක්දිව ප්‍රථම ජනපදිකයින් වූ විජය ප්‍රධාන පිරිස

---

2 බලගල්ලේ විමල් ජී. සිංහල භාෂාවේ සම්භවය හා පරිණාමය (සි.භා.ස.ප.) ඇස් ගොඩගේ සහෝදරයෝ, මරදාන, 1992, 6 පිටුව

3 "The early History of Ceylon" Cambridge History of India, ed. EJ Raion, Ancient India, Cha. XXV

මෙහි පැමිණ ඇත්තේ ගංගා නිම්න ප්‍රදේශයෙන් බැ කියයි.[4]

එම වසරේදී ම ෆ්‍රෙඩ් සිල්වා "සිංහල යන වචනය" යන මාතෘකාව යටතේ ලංකා පුරා තත්ත්ව හා සාහිත්‍ය වාර්තා සඟරාවට ලියූ ලිපියට අනුව විජයාගමනයට පෙර ලක්දිව හෙළ ජනයා සිටි බවත් පඬුව උතුරු ඉන්දියාවේ සිංහපුරයෙන් පැමිණ ජනාවාස පිහිටි වූ පිරිසෙහි නායක විජය කුමරු ගෝත්‍ර නාමය අනුව විජය සිං නමින් හඳුන්වන්නට ඇති බවත් ඔවුන් හෙළයන් සමඟ මිශ්‍ර වීමෙන් සිං + හෙළ - සිංහල නමින් හැඳින්වෙන්නට ඇති බවත් පවසයි.[5]

යථෝක්ත විද්වත් මත විජය පිළිබඳ ඓතිහාසික පුරාවෘත්තය පදනම් කරගෙන සිංහලය ඉන්දු ආර්ය භාෂා ගණයට අයත් බව තහවුරු කිරීම අරමුණු කොට දැක්වූ මතවාද ලෙස පෙන්වා දිය හැකිය.

ඉහතින් දැක්වූ ඓතිහාසික සාධක මෙන් ම භාෂා විද්‍යාත්මක සාධක ද සිංහලය ඉන්දු ආර්ය ගණයේ භාෂාවක් බව ඔප්පු කරයි. දැනට විද්‍යමාන පැරණිතම සෙල්ලිපි බස මුල් සිංහලය සම්බන්ධ නිදසුන් සපයයි. අද ග්‍රන්ථ ව්‍යවහාරයේ පවත්නා සිංහලය ද එම මුල් සෙල්ලිපි බසෙහි ක්‍රමානුකූල විකාශයක් ලෙස ගැනිය හැකිය. ක්‍රි.පූ. 3 වන ශත වර්ෂයේ මෑත භාගයෙහි ලියැවී ඇති පොත් පත්වල ද සිංහල භාෂාවේ ඒ ඒ අවස්ථාවලට අයත් ලක්ෂණ තැන්පත් වී ඇත.[6]

---

4 Turner L.J.B. Hand Book of Commercial and General Information for Ceylon, Colombo 1922, pp 7 – 12

5 Silva Fred "The Term Sinhala" Ceylon Antiquary and Literary Register, viii, 1922, pp 65 – 66

6 කුලසූරිය ආනන්ද, සිංහල සාහිත්‍යය, සමන් මුද්‍රණාලය, මහරගම, 1956, 59 පිටුව

ලක්දිව පැරණිම සිලා ලිපිය අයත් වන්නේ ක්‍රි.පූ. 3 සියවසටයි. සිංහළ ශබ්ද කෝෂ කර්තෘවරුන්ගේ බෙදීම අනුව ප්‍රථම අවධියට අයත් ලිපි ලෙස ගල්ලෙන් වල කොටා ඇති ලිපි සැලකිය හැකිය. ක්‍රි. පූ. 3 සියවසේ සිට ක්‍රි. ව. 4/5 සියවස් දක්වා කාලය ප්‍රාකෘත යුගය ලෙස ගයිගර් සිංහල ව්‍යාකරණයෙහි දක්වා ඇත.[7] මෙම යුගයේ ලියවී ඇති සෙල්ලිපි බස පිළබඳ විමසීමේ දී සිංහල බසෙහි ප්‍රාකෘත භාෂා ලක්ෂණ බෙහෙවින් දැක ගත හැකිය.

වාග් විද්‍යාවට අනුව "භාෂාමය සෑණිකරණයට නිදසුන් රැසක් සිංහලයෙන් ලබා ගත හැකිය. සිහලයේ විකාශනයට මූල් වූ මාතෘ භාෂා සම්ප්‍රදාය වශයෙන් සැලකිය හැක්කේ සංස්කෘතයයි. ක්‍රමික ශබ්ද පරිණාම ධර්මවල ප්‍රතිඵලයක් වශයෙන් සංස්කෘත මූල සම්ප්‍රදායෙන් සිංහල ප්‍රභූත වූ අයුරු යථාර්ථ න්‍යාය ධර්ම පද්ධතියක අනුසාරයෙන් පෙන්වා දිය හැක. සිංහල භාෂා සාහිත්‍යයේ බලපෑම නිසා සිංහල භාෂාවේ වර්ධනයේ විවිධ අවස්ථාවල දී භාෂාමය සෑණිකරණයේ ප්‍රතිඵලයක් වශයෙන් ද විවිධ රූප සිංහලට එකතු වී ඇත.[8]

මේ අනුව පාලි, ප්‍රාකෘත වැනි මාධ්‍ය ඉන්දු ආර්ය භාෂාවලින් බිඳී සිංහලට එකතු වූ වචන රාශියක් මෙහි දී විමසීමට ලක් කිරීම සිංහල භාෂාව ඉන්දු ආර්ය ගණයට අයත් ය යන්න පැහැදිළිව සනාථ කිරීම සඳහා වාග්විද්‍යාත්මක සාධක දැක්වීමේ දී ඉතා වැදගත් වේ.

---

7
8 Geiger Wilhelm, A Grammar of the Sinhalese Languages, Colombo, 1938, pp 18
8 කරුණාතිලක ඩබ්.එස්, ඓතිහාසික වාග් විද්‍යා ප්‍රවේශය, සිමාසහිත ගුණසේන සහ සමාගම, කොළඹ 1989, 41 පිටුව

ක්‍රි.පූ. 3 සියවසට අයත් ලෙන් ලිපි කිහිපයක් පාලියට නගා සිංහල භාෂාව හා පාලි භාෂාව අතර සබඳතාව වටහා ගත හැක. අනුරාධපුරයේ වෙස්සගිරි ලෙන් ලිපි පෙළ නිදසුන් ලෙස දැක්විය හැක.

"තලදර නගහ පුත දෙවහ ලෙණෙ
අගත අනගත චතුදිශ ශගශ,"[9]

මෙය මෙසේ පාලියට නැඟිය හැකිය.

තුලාධර නාගස්ස පුත්තස්ස දෙවස්ස ලෙණං
ආගතානාගතස්ස චාතුද්දිසස්ස සංඝස්ස

"දෙවන පිය මහරජ බරිය බකිතිය උපසික
වරුණ දතය ලෙණෙ"

පාලි

දේවානං පිය මහරාජසස භරියාය භගිනියා
උපාසිකා වරුණදත්තාය ලෙණං

මෙම ලිපිවල පෙනෙන භාෂා ලක්‍ෂණ මෙසේ විමසීමට ලක් කළ හැකිය.

(අ) පාලියෙහි මෙන් ම මෙහි ස්වර මධ්‍යයෙහි වූ කේවල කණ්ඨජයත් කේවල දන්තජයත් ලොප් නොවී සිටී. ඇතැම් විට ලිඛිත ප්‍රාකෘතයෙහි ද නූතන සිංහලයෙහි ද හැමකල්හිම ලොප් නොවේ.

උදා. ආගත - අගත ආ - සිංහල
චතු - චතු සිවු - සිව්

---

9 Epigraphia Zeylanica, vol. I, pp 10 - 34

මෙහි දෙවනු කොට දැක්වෙන අගත වතු ආදි රූප පුරාතන සෙල්ලිපිවල දක්නට ලැබේ.

(ආ) ලක්දිව ශිලා ලිපිවල එන පුරාතන ඉන්දු ආර්ය මහාප්‍රාණාක්‍ෂර අල්පප්‍රාණ මඟින් නියෝජනය වීම ද ඉන්දු ආර්ය භාෂාවකින් හෝ කිහිපයකින් සිංහලය සම්භවය වූයේ යැයි පැහැදිළි වන ලක්‍ෂණයක් වේ.

හරියා > බරිය    සංඝ > සග

ඡත්ත > චත

මෙහි දෙවනුව දක්වා ඇත්තේ ක්‍රි. පූ. 3 වන සියවසේ සිට ලිය වී ඇති ලක්දිව සෙල්ලිපිවල දක්නට ඇති රූපයයි.

(ඉ) පාලි සම්බන්ධ විභක්ති ප්‍රත්‍ය වූ, ස්ස, ප්‍රත්‍ය ලක්දිව සෙල්ලිපිවල "හ" ප්‍රත්‍යයෙන් නියෝජනය කිරීම ද සිංහල බසෙහි දක්නට ඇති ආර්ය භාෂාවල ආභාසය පැහැදිළි කෙරේ.

උදා- දේවානං පිය මහා රාජස්ස > දෙවන පිය මහ රජහ    දෙවස්ස > දෙවහ.

මෙහි දෙවන රූපය ලෙස දක්වා ඇත්තේ ලක්දිව සෙල්ලිපිවල දක්නට ඇති ආකාරයයි.

(ඊ) සංයුක්තාක්‍ෂර කේවල අක්‍ෂරවලින් නියෝජනය කිරීමේදී සිංහල ඉන්දු ආර්ය ප්‍රාකෘති සමඟ ඇති නෑ සබඳ කම පැහැදිලි කෙරේ.

ඒ සමඟම සිංහලය ද්‍රවිඩ භාෂා ගණයේ සම්භවය වූවක් නොව ඉන්දු ආර්ය ප්‍රාකෘත විශේෂයකින්

සම්හවය වූවක් ය යන කරුණ සනාථ කිරීම සඳහා හාෂාවල ඥාති සම්බන්ධතා පිරික්සීමේ දි ඉතා වැදගත් වන්නා වූ ප්‍රාකෘත යුගයේ සිංහල බසේ යෙදුණු, ශබ්දිම පද්ධතිය ලේඛනයෙහි නියෝජනය කළ ආකාර දෙමළ බසෙහි ශබ්දිම පද්ධතිය සමග සැසැඳීම ඉතා වැදගත් වේ.[10]

සිංහල බසෙහි ශබ්දිම පද්ධතිය නියෝජනය කළ ප්‍රාකෘත යුගයට අයත් වර්ණ මාලාව මෙසේය.

අ ඉ උ එ ඔ
ක ග ච ජ ට ඩ ණ
ත ද න ප බ ම
ය ර ල ව ශ/ස*හ ළ

ද්‍රවිඩ ලේඛන අතුරින් පැරණිතම ලේඛනයට උරුම කියන දෙමළයෙහි වාර්තාගත ලේඛනය පටන් ගෙන ඇත්තේ, සිංහලය ලියන්නට සියවස් හතකට පසුවයි. තොල්කාප්පියම් වැනි පැරණි වියරණ අනුසාරයෙන් දෙමළයේ මූලික ශබ්ද නියෝජනය කරන අක්ෂර රූප සසඳා බැලිය හැකිය.[11]

අ ආ ඉ ඊ උ ඌ එ ඒ ඓ
ඔ ඕ ඖ අඃ
ඛ ක ච ඥ ට ණ ත න
ප ම
ය ර ල ච ව ළ ල ටු න

මෙම අක්ෂර මාලාවන් දෙක සසඳන විට ඒ දෙක අතර වෙසෙසින් කැපී පෙනෙන වෙනසක් නම් සිංහලයෙහි වෙනත් ඉන්දූ ආර්ය හාෂාවල මෙන් කල ගල චල ඩල තල දල පල බ යනුවෙන් දැක්වූ

10 බලගල්ලේ විමල් ජී. සිං. හා. ස. ප. 27 - 28
11 බලගල්ලේ විමල් ජී. ඉහත සඳහන් කළ ග්‍රන්ථය 27 - 28 පිටුව

ස්පර්ශ ව්‍යඤ්ජනයන්ගේ ඝෝෂ අඝෝෂ භේදයක් ඇතත් දෙමළයෙහි එසේ දක්නට නොලැබීමයි. මෙසේ ශබ්ද පද්ධතිය නියෝජනය කරන අක්ෂර මාලා සැසඳීමෙන් මෙන් ම ඓතිහාසික ව්‍යාකරණමය සාධක පිළිබඳ අවධානය යොමු කිරීමෙන් ද සිංහලය ඉන්දු ආර්ය භාෂා ගණයට අයත් බව පැහැදිලි වේ.

මෙම අදහසට විරුද්ධව අදහස් දක්වා ඇති ඩබ්.එෆ්. ගුණවර්ධන නම් පඬිවරයා සිංහලය ද්‍රවිඩ ගණයේ භාෂාවක් ලෙස පෙන්වා දී ඇත. 1918 දී සිංහල භාෂාවේ ප්‍රභවය පිළිබඳ ශාස්ත්‍රීය දේශනයක් පවත්වමින් සිංහලය අවශ්‍යයෙන් ම ද්‍රවිඩ භාෂාවක් වන බවත් පළ කර ඇත.[12]

මේ වන විට සිංහලය ආර්ය ප්‍රකෘතයකින් ප්‍රභවය වූයේ යැයි යන මතය ගත් උගතුන් බොහෝ දෙනෙක් සිංහලය උතුරු ඉන්දියානු ආර්ය භාෂා ගණයට අයත් බව පැවසීම සඳහා ඉදිරිපත් කළ ඉහතින් දැක්වූ කරුණු පදනම් කරගත් "සිංහලය පාලියෙන් බිඳුණු නැතහොත් පාලි භාෂාව හා සමීප සම්බන්ධතාවක් ඇති ප්‍රාකෘත විශේෂයකින් පරිණාමයට පත් වූ භාෂාවක්ය" යන අදහසට විරුද්ධව කරුණු රැසක් ගුණවර්ධන විසින් දක්වන ලදි. සිංහලය හා දෙමළය අතර නෑ සබඳ කම දැක්වීමට ඔහු භාෂාමය කරුණු රැසක් දක්වා ඇත.

1. පාලියෙහි ආඛ්‍යාත කාල භේද - අටක් ඇති අතර දෙමළයේ මෙන්ම සිංහලයේ ඇත්තේ අතීත වර්තමාන අනාගත යනුවෙන් කාල තුනකි.

---

12 Gunawardene WF "The Origin of the Sinhala Language, Colombo, 1918, p. 21

2. පාලියෙහි ක්‍රියාපද සම්බන්ධයෙන් අත්තනෝ පද, පරස්ස පද භේදයක් ඇත. දෙමළයේ එබඳු භේදයක් නැත.

3. පාලියෙහි විශේෂණ පදය ලිංග සංඛ්‍යා විභක්ති භජනය කරමින් වරනැගේ. දෙමළයෙහි මෙන් ම සිංහලයෙහි විශේෂණ පදය වරනොනැගේ.

මෙසේ ගුණවර්ධන සිංහලය දෙමළ බසින් ප්‍රභවය වූවක් යැයි යන මතය තහවුරු කළ ද එය සමකාලීන උගතුන්ගේ නිර්දය විවේචනයට හා සම්විචලයට ලක් වූ බව සී.ඒ. විජේසිංහගේ "සිංහල ආර්යයෝ" නම් ග්‍රන්ථයෙන් පැහැදිලි වේ.[13]

1918 "සිංහල භාෂාවේ ප්‍රභවය" යන මැයෙන් කථා කරමින් මුදලි ගුණවර්ධන කියා සිටියේ වංශ කථාවල සඳහන් විජය ආදී පිරිස ආර්යයන් වූ නමුදු, හරය අතින් බලන විට සිංහලයෙහි දක්නට ඇත්තේ ලක්දිව මුල් වැසියන්ගේ බස වූ ද්‍රවිඩ භාෂාවක ලක්ෂණ බවයි.

මෙම මතය තියුණු ලෙස විවේචනය කළ විද්වතෙකි සී.ඒ. විජේසිංහ. ඔහු ගුණවර්ධනගේ සිංහල භාෂාවේ ප්‍රභවය යන ලිපියට පිළිතුරු සපයමින් "සිංහල ආර්යයයෝ" නම් ග්‍රන්ථයෙන් සිංහල භාෂාවේ සම්භවය සිදුවූයේ ආර්යය ජනතාවකින් බවත් සිංහලය ඉන්දු ආර්යය ගණයේ භාෂාවක් බවත් ස්ථාපිත කිරීමට සාධක ඉදිරිපත් කොට ඇත.[14]

ලක්දිව විසූ ගුජරාති ජාතික සිවිල් නිලධරයෙකු වූ එම්.එච්.එච්. කාන්තිවාල ද සිංහලයේ ප්‍රභවය පිළිබඳ

---

13 **Wijesingha CA, Sinhala Ariyans, Bastian and Co. 1921 cha. 1**

14 **Gunawardene WF OP. Cit, Cha. I**

ගුණවර්ධන මතය විවේචනය කළ භාෂා වේදියෙකි. සිංහලය ද්‍රවිඩ ගණයේ භාෂාවක් නොවන බව ප්‍රකාශ කළ කාන්තිවාල එය ඉන්දු ආර්ය භාෂා ගණයට අයත්ය, යන මතයට පක්ෂව කරුණු රැසක් ගෙනහැර දැක්විය. ගුණවර්ධන මහතා ර. අ. ස. ලං. ශා. ඉදිරියේ කළා වූ යථෝක්ත ලිපියේ උධෘතයක් 1921 ටයිම්ස් ඔෆ් සිලෝන් පත්‍රයෙහි ද පළ විය. කාන්තිවාල මෙයට පිළිතුරු ලිපියක් පළ කිරීමෙන් පසු දෙදෙනා අතර වාදයක් ඇරඹිණි. මෙම වාදය ටයිම්ස් පත්‍රය මහින් ද "ලංකා පුරා තත්ත්ව හා සාහිත්‍ය වාර්තා" සඟරාව මහින් ද 1921 – 23 වර්ෂ තුළ කරගෙන යන ලදි.

මෙහි දී කාන්තිවාල ගුණවර්ධනට කලින් ද්‍රවිඩ මත ඉදිරිපත් කළ ජේ. විම්ස්ට ද පිළිතුරු දෙයි. මෙහිදී ඔහු නූතන හින්දු භාෂාවක් වශයෙන් වාග් වේදීන් විසින් අවිවාදයෙන් පිළිගනු ලැබ ඇති ගුජරාති භාෂාවේ ත් සිංහල භාෂාවේ ත් විද්‍යමාන වන සමාන ලක්ෂණ පෙන්වා දී ඇත. කාන්තිවාල දක්වන අදහස්වලට අනුව ගුජරාති ය මෙන්ම සිංහලය ද අනෙකුත් ඉන්දු ආර්ය භාෂාවන් මෙන් මධ්‍ය ඉන්දු – ආර්යය ප්‍රාකෘත අවධියේ සිට ක්‍රමයෙන් විකාශනය වූවකි. වෙනත් බොහෝ නූතන ඉන්දු ආර්යය භාෂාවන් මෙන් නොව සමීපස්ත අනාර්ය භාෂාවන්ගේ බලපෑමට වැඩිපුර හසු නොවී වෙන්ව වැඩුනකි. ගුජරාතිය ද ඉන්දියාවේ වෙනත් නූතන ඉන්දු ආර්ය භාෂා තරම් ද්‍රවිඩ ගණයන්ට අයත් අනාර්ය භාෂාවන්ගේ බලපෑමට යටත් නොවීය. ගුජරාතියේත් සිංහලයේත් සමාන ලක්ෂණ රාශියක් දැකිය හැක්කේ එහෙයින්ය, යනු කාන්තිවාලගේ අදහසයි.

මෙම විග්‍රහයට අනුව කාන්තිවාල සිංහල බස ගුජරාති බස හා සසඳමින් මේ භාෂා දෙකම ඉන්දු ආර්ය ගණයේ භාෂා ලෙස සහේතුකව පෙන්වා දී ඇති බව පෙනේ.

එසේම 1926 "වංග භාෂාවේ ප්‍රභවය හා අභිවර්ධනය" නම් ඉතා වැදගත් නිබන්ධය ලියූ මහාචාර්ය සුනිත් කුමාර් චැටර්ජි ද සිංහලය ඉන්දු ආර්ය භාෂාවක් යන නිගමනයට එළඹ සිටියකි. සිංහලය ප්‍රථම මධ්‍ය ඉන්දු ආර්ය (ප්‍රාකෘත) යුගයට අයත් පුරාතන ගුජරාති උපභාෂණයකින් පැවත ආවක් විය හැකි බවත් පවසයි.[15]

පුරාතන ලංකාවේ ඉතිහාසය ලංකාවේ ශිලා ලිපින් හොඳින් අධ්‍යයනය කළ ඉතිහාසඥයෙකු වශයෙන් මෙන් ම පුරාවිද්‍යාඥයෙකු වශයෙන් ද ප්‍රසිද්ධ ඉංග්‍රීසි ජාතික සිවිල් නිලධාරියෙකු වූ එච්.ඩබ්. කොඩ්රිංටන් ද 1926 දී "සංක්ෂිප්ත ලංකා ඉතිහාසයක්" නැමැති කෘතිය ප්‍රකාශයට පත් කරමින් සිංහලය ඉන්දු ආර්ය ගණයේ භාෂාවකැයි යන මතය අනුමත කර ඇත.[16]

ඉන්දු ආර්ය භාෂාවන්ගේ ඉතිහාසය පිරික්සූ වාග් විද්‍යාඥයන් සැමදෙනාම සාහේ පිළිගත් කරුණක් නම් ඉන්දු ආර්ය භාෂා ඉතිහාසය, පුරාතන ඉන්දු ආර්ය යුගය, මධ්‍ය ඉන්දු ආර්ය යුගය, නූතන ඉන්දු ආර්ය යුගය යනුවෙන් යුග තුනකට බෙදීමයි. මෙයින් මධ්‍ය ඉන්දු ආර්ය (ප්‍රාකෘත) යුගය ප්‍රාථමික ප්‍රාකෘත, ද්විතියක ප්‍රාකෘත, තෘතියික ප්‍රාකෘත යනුවෙන් අවස්ථා තුනකට බෙදනු ලැබේ. චැටර්ජිගේ කාල ගණනය අනුව ක්‍රි.පූ. 600–200 කාල

---

15 Gunawardene WF, Times of Ceylon, 17/10/1921, Ceylon Anatiquary and Literary Register, Vol. viii - 3 pp 193 f ix - 1 pp 121 f
Kantiwala MH Times of Ceylon, 20/10/1921, Ceylon Antiquary and Literary Register, Vol. vii – 2 pp 105 f, vii 4 –pp 208 f

16 Chatterjee Suneet Kumar, Origin and Develpment of Bengali Language, Vol. I Calcutta, 1926 p 58

පරිච්ඡේදය ප්‍රාථමික මධ්‍ය ඉන්දු ආර්ය යුගයට ද ක්‍රි.පූ. 200 සිට ක්‍රි.ව. 200 කාල පරිච්ඡේදය සංක්‍රාමික මධ්‍ය ඉන්දු ආර්ය සමයට ද ක්‍රි.ව. 200 සිට ක්‍රි.ව. 600 කාල පරිච්ජ්දය ද්විතීයක මධ්‍ය ඉන්දු ආර්ය සමයට ද (අපභ්‍රංශ) වැටේ. මෙයින් ප්‍රාථමික මධ්‍ය ඉන්දු ආර්ය යුගයට අයත් ප්‍රාකෘත උපභාෂණ විශේෂයකින් සිංහල භාෂාව ප්‍රභවය වී ඇත්තේය.[17] ගයිගර් අනුව යමින් වැටර්පි ද සිංහලයත් මාල දිවයින් බසත් අතර ඇති සමීප සම්බන්ධය පිළිගන්නා අතර මාලදිවයින් බස ක්‍රි.ව. 9–10 සියවස්වල හෙළ බසින් බිඳුණක් විය හැකි බව ද පවසයි.[18]

වැටර්පිගේ මෙම විග්‍රහය සිංහලය ඉන්දු ආර්ය ප්‍රාකෘත විශේෂයකින් ප්‍රභවය වූයේය යන්න සනාථ කිරිම සඳහා කළ දිර්ඝ මෙන් ම විමර්ශනාත්මක විග්‍රහයක් ලෙස පිළගත හැක.

මේ අනුව ඉහතින් සඳහන් කළ ඓතිහාසික වාග් විද්‍යාත්මක සාධක මෙන් ම විද්වත් මත ද විමසිමට ලක් කිරීමේදි සිංහලය ඉන්දු ආර්ය ප්‍රාකෘත විශේෂයකින් සම්භවය වූ බසක් මිස ද්‍රවිඩ සම්භවයක් ඇති බසක් නොවන බව නිගමනය කළ හැක. භාෂා පරිණාමයේ දි ද්‍රවිඩ බසින් ආ වචන සිංහලයේ භාවිත වුව ද එම කරුණු පදනම් කොට සිංහලය ද්‍රවිඩ ගණයේ භාෂාවක් යැයි නිගමනය කිරීම යුක්ති යුක්ත නොවන බව ද මෙහි දි අවධාරණය කළ යුතුය.

---

17 Condrington HW, A Short History of Ceylon, London, 1926, p 6

18 Ibid pp 18 - 19